# මිනිසත් බවේ අගය

ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි මහතා විසිනි

සංඛ්‍යා ලේඛනවලින් හෙළිවන අයුරු අවුරුද්දක් තුළ අප රටේ සිදුවන අකල් මරණ සංඛ්‍යාව අතිවිශාල ය. අපරීක්ෂාකාරී රිය පැදවීම, අපරාධ කරුවන්ගේ ක්‍රියා, වැළැක්විය හැකි වුණත් එසේ නොවන රෝගාබාධ ආදී වූ හේතු ගණනාවක් එයට බලපායි.

නිර්මාණවාදීන් උසස් ම දේව නිර්මාණය ලෙස ද, බුදු දහම උසස් ම සත්ත්වයා ලෙස ද පිළිගැනෙන මිනිසා මෙසේ මියයන්නේ මනුෂ්‍යත්වයේ ඇති දුර්ලභත්වය හෝ ශ්‍රේෂ්ඨත්වය නොසිතන මිනිසුන් නිසා ය. **"දුල්ලභං ච මනුස්සත්තං"**, **"කිච්චෝ මනුස්ස පටිලාභෝ"** ආදී ලෙසින් විවිධ තැන්වල විවිධාකාරයෙන් මිනිසත් බවේ වැදගත්කම බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබේ.

ඡිග්ගල, බාල පණ්ඩිත වැනි සූත්‍රයන්ගෙන් හෙළිවන අයුරු මිනිසකු ලෙස ඉපදීම, මුහුදු පතුලේ සිට අවුරුදු සියයකට වරක් ජලය මතුපිටට එන කණ කැස්බෑවකුට, මුහුදේ විවිධ දිසාවනට පාවෙමින් තිබෙන එක සිදුරක් ඇති විය දඬුවකින් හිස දමා අහස බලන්නට ලැබීම වැනි දුර්ලභ සිද්ධියකි. දුගතියක උපත ලබා සිටින සත්ත්වයකු මිනිසත් බව ලැබීම මෙයට ද වඩා දුර්ලභ බව බුදුහාමුදුරුවෝ වදාරති.

සත්ත්වයන් අතර උසස් මනසක් ඇති සත්ත්වයා නිසා මිනිසා යනුවෙන් හඳුන්වනු ලැබේ. මිනිසකු ලෙසින් පත්විය හැකි උසස් ම සත්ත්වය වන බුද්ධත්වයට පත්විය හැක්කේ ද මිනිසකුට පමණි. එසේ ද වුවත් මනුෂ්‍යත්වයට නිගා දෙන මනුෂ්‍ය නේරයිකයෝ ද, මනුෂ්‍ය ප්‍රේතයෝ ද මනුෂ්‍ය තිරශ්චීනයෝ ද සිටිති.

මිනිසා විමුක්තිය සඳහා දැක තේරුම් ගත යුතු අනිත්‍ය දුක්ඛ අනන්ත ත්‍රිලක්ෂණය ද මිනිසුන් ද සතුන් ද භෞතිකයද අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධතාව මෙන් ම පරපටිබද්ධතාව දැකගැනීමට සුදුසු ම ස්ථානය මනුෂ්‍ය ලෝකය යි. එයට හේතුව මිනිස් ලොව ආයු කාලය ඉතා දීර්ඝ හෝ ඉතා කෙටි නොවීම මිනිස් ලොව සැප සම්පත් අධික හෝ දැඩි දුක් සහිත තැනක් නොවීම හා උපත විපත ලෙඩවීම ජරාවට පත්වීම මරණය නිරන්තරයෙන් දක්නට ලැබීම ය.

දේවත්වයට ද වඩා මනුෂ්‍යාත්වය උසස් බව පෙන්වා දී තිබෙන අයුරු සූත්‍ර ධර්මයන්ගෙන් පෙනේ වරක් ශක්‍රදේවේන්ද්‍රයා මාතලී නම් රියැදුරු අමතා ප්‍රකාශ කළේ තමන් සිල්වත් වූ, පින්කරන, ධාර්මිකව අඹු දරුවන් පෝෂණය කරන ගෘහස්ථයන්ට වඳින බවයි.

දෙවියකු දෙව්ලොවින් චුතවන අවස්ථාවේ දී අනෙක් දෙවිවරුන් කියන්නේ, ඔහුට මෙතනින් චුතව ගොස් සුගතියේ උපදින්න කියා ය. දෙවියන් සුගතිය යැයි කීවේ මනුෂ්‍ය ලෝකයට යැයි බුදුහාමුදුරුවෝ වදාළහ. මිනිසාට සිතා බලා ක්‍රියා කිරීමේ ශක්තියක් නැතැයි තමාගේ පිළිගැනීම බව බමුණු තරුණයෙක් කියා සිටියේ ය. ඔබ ද කැමති නම් ඉදිරියට එන්නත්, කැමතිනම් ආපසු යන්නත් පුළුවන් නේ දැයි ඇසූ බුදුහාමුදුරුවෝ එය ම පුද්ගලයා සතු සිතා බලා ක්‍රියා කිරීම බව වදාළහ.

ලෞකික ලෝකෝත්තර අරමුණු ඉටුකර ගැනීමෙහිද, විමුක්ති ය සාදා ගැනීමේ ද බුදුරජාණන් වහන්සේ තරම් මිනිසා සතු ශක්තිය ඉතා උසස් බව පෙන්වා දුන් අන් ශාස්තෘවරයෙක් නැතැයි කිව යුතුව ඇත. අනුන් සරණ නො පතා තමන් සරණ යන්නැයි වදාළහ. තථාගතයන් දහම කියා දෙනවා පමණි, ක්‍රියා කළ යුත්තේ ඔබ ම යැයි වගකීම පුද්ගලයා කෙරෙහි ම පැවරූහ. අකුසල් ප්‍රහාණය කිරීමටත්, කුසල් වර්ධනය කර ගැනීමටත් නුපුළුවන් නම් එසේ කරන්නැයි තමන් වහන්සේ නොදෙසන බවත් එය පුළුවන් නිසා ම එසේ කරන්නැයි වදාරන බවත් අවධාරණය කළහ. තමන් සතු ඒ ශක්තිය පිළිගෙන ක්‍රියා නොකළහොත් මිනිසා වැටෙන්නේ ඉතා ඛේදජනක තත්ත්වයකට ය.

යහපත් ක්‍රියාකොට සුගතියක ඉපදීම කාටත් කළ හැකි ය. එහෙත් එසේ උපන් තැනැත්තා යළි සතර අපායේ වුව ද උපත ලැබිය හැකියි. එනිසා කළ යුත්තේ කිසිදා දුගතිගාමී නොවන තැනට කරුණු සකසා ගැනීම ය. නැවත කිසිදා දුගතිගාමී නොවන පිළිවෙත බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සේක. එය ඔබ දැනට ගත කරන ගෘහස්ථ ජීවිතය එලෙස ගතකරමින් එනම් අඹු දරුවන් පෝෂණය කරමින්, රැකියා කර ධනය සපයා ගනිමින් සමාජ කාර්යයන්හි නිරත වෙමින් සුඛෝපභෝගී හෝ කාමභෝගී ජීවිත ගත කරමින් ඉටු කර ගත හැක. ඒ සඳහා පුහුදුන් බව ඉක්මවා දහම් මගෙහි පිහිටිය යුතු ය. දැනට ගත කරන ජීවිතයට ධාර්මිකත්වය එක් කර ගනිමින් එය කළ හැකිය. ගුණධර්ම කිහිපයක් වර්ධනය කර ගැනීමෙන් දහම් මගට පැමිණි ශ්‍රාවකයාට මේ ජීවිත කාලය තුළදී ම සෝතාපත්ති ඵලයට පත්විය හැකියි. සෝතාපන්න ශ්‍රාවකයා නැවත කිසිදා දුගතිගාමී නොවන්නෙකි. සම්බෝධිය නියතවූවෙකි. මේ තත්ත්වයට පත්වීම බෞද්ධයකු වශයෙන් මනුෂ්‍යාත්වයෙන් ලැබිය හැකි උපරිම ඵලය ලැබීම ය.

Go to Table of Contents